**ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් - 2018**
**-----------------------------------------------**

**මතය**
------
ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්හි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතිය යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

--------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් ‟මනා ලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (1) හා (3) වගන්තිය, 2009 ඔක්තෝබර් 01 දිනැති අංක ඩීඑම්ඒ/2009 (3) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ආයතන සඳහා වූ අභ්‍යන්තර විගණන | අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වය ආරක්ෂා වීම පිණිස අභ්‍යන්තර විගණන වාර්තා පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතු වුවත්, සමාගමේ අභ්‍යන්තර විගණන වාර්තා එක් එක් අංශ ප්‍රධානීන් වෙත නිකුත් කර තිබුණි. | ඉදිරියේදී ජාතික විගණන පනතේ 40 විධාන ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. | යොමුගත ප්‍රතිපාදන වලට අනුව අභ්‍යන්තර විගණක කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| ප්‍රමිතීන් අංක 1110.A 1 | | | |
| (ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) වන උපවගන්තිය | අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරනු ලැබූ විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ජාතික විගණන පනතේ 40(4) වන උප වගන්තිය අනුව කටයුතු කරනු ලබයි. | පනතේ ප්‍රතිපාදනයන්ට අනුකූලව අභ්‍යන්තර විගණක කටයුතු කල යුතුය. |
| (ඇ) 2014 ජනවාරි 06 දිනැති අංක 01/2014 කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2 ඡේදය<br><br>ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති යහපාලනය පිළිබඳ චක්‍රලේඛය | සමාගම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව කාර්ය මණ්ඩල හා අදාල වැටුප් තීරණය කරනු නොලබන ආයතනයක් බැවින් ජීවන වියදම් දීමනාව හිමි නොවන අස්ථිත්වයක් වුවද 2018 වර්ෂයේදී ජීවන වියදම් දීමනාව ලෙස රු. 8,847,915 ක් ගෙවා තිබුණි. | ජීවන වියදම් දීමනාව ලබාදීම සඳහා 2018 මැයි 03 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුමැතිය ලබා ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා වෙත 2018/02/16 වන දින යවන ලද ලිපියට ප්‍රතිචාර දක්වමින් අදාල රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා 2018/02/23 දින අධ්‍යක්ෂ ජෙනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යවා මේ සඳහා අනුමැතිය ඉල්ලා ඇත.මෙතෙක් එම දෙපාර්තමේන්තුවෙන් ලිඛිත අනුමැතියක් ලැබී නොමැත. | චක්‍රලේඛ ප්‍රතිපාදන වලට අනුකූලව කළමනාකරණය කටයුතු කල යුතුය. |
| (i) 5.1.1 මාර්ගෝපදේශය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සමාගම විසින් 2018 දෙසැම්බර් 31 දින වන විටත් එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මේ වන විට පුවත්පතෙහි පළකරන ලද දැන්වීම (Letter of Invitation) අනුව එවා ඇති යෝජනා ඉදිරියේදී පත්කිරීමට නියමිත කමිටුව විසින් සලකා බලනු | චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඇත. ඒ අනුව සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම ඉදිරියේදී සිදු කරනු ඇත. | |
| (ii) 8.2.2 මාර්ගෝපදේශය | රජය සතු සමාගමක් විසින් කෙටිකාලීන තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු හෝ වෙනත් මූල්‍ය ආයෝජනයන් සිදු කරන්නේ නම් මුදල් අමාත්‍යවරයාගේ එකගතාවය (Concurrence) ලබාගත යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු. 464,447,786 ක ආයෝජන සඳහා එම එකගතාවය ලබා ගෙන නොතිබුණි. | ඉදිරියේදී සිදු කරන නව ආයෝජන සඳහා අදාල අනුමැතීන් ගැනීමට කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |
| (iii) 9.3.1 මාර්ගෝපදේශය | සමාගම සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබාගෙන නොතිබුණි. | එකඟ වේ. | චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |
| (ඉ) 2017 මාර්තු 21 දිනැති අංක පීඊ/පීඑස්/ජේසීටීඑල්/ 2017 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සමාගමේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලද ලිපිය හා 2018 අප්‍රේල් 24 දින රේඛීය | සමාගමේ 2015 දෙසැම්බර් 31 දිනට වූ රු. 330,038,900 ක සමුච්චිත ලාභයෙන් සියයට 10 ක් හා 2016 වර්ෂයේ රු.77,651,525ක ශුද්ධ ලාභයෙන් සියයට 30 කට සමාන වන රු. 23,295,457 ක් ලාභාංශ ලෙස 2017 ජූලි 31 දිනට පෙර ඒකාබද්ධ අරමුදලට බැර කරන | 2017 මාර්තු 21 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ලිපියට පිළිතුරු ලෙස 2017 මාර්තු 30 දින එවකට වැඩ බලන සභාපතිතුමා විසින් මෙම මුදල වරාය අධිකාරිය මගින් ගෙවිය යුතු බව දන්වා ඇත. තවද ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්හි | ලිපියෙහි නීතිමය තත්ත්වය සොයා එහි සඳහන් ආකාරයට කටයුතු කිරීම කළමනාකරණයේ වගකීම වේ. |

| | | |
|---|---|---|
| අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලද අංක පීඊ/පීඑස්/ජේසීටීඑල්/ 2018 දරන ලිපිය. | ලෙස දන්වා තිබුණ ද 2018 දෙසැම්බර් 31 දින වන විටත් අදාල මුදල් මහා භාණ්ඩාගාරය වෙත ලබා දී නොතිබුණි. තවද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට අදාල ලාභාංශ මුදල ශ්‍රී ලංකා වරාය අධිකාරිය හරහා එවන ලෙස සමාගම දැනුවත් කරන මෙන් අමාත්‍යාංශයට දන්වා තිබුණද 2019 මාර්තු 31 දින වන තෙක් අදාල ප්‍රේෂණයන් සිදු කර නොතිබුණි. | මාසික ආදායමෙන් සියයට 50 ක ප්‍රමාණයක් වරාය අධිකාරියට බැර කෙරෙන අතර මීට අමතරව වාර්ෂිකව ලාභාංශ ද මව් ආයතනය වෙත ගෙවනු ලබයි. මෙය පසුගිය වසර තුල ද අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වාර ගණනාවක් දී සාකච්ඡාවට ලක් වුවද අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වූයේ මෙය ශ්‍රී ලංකා වරාය අධිකරිය විසින් ගෙවිය යුතු බවයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 91,294,628 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු. 104,736,091 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 13,441,463ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පරිපාලන වියදම් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| ආදායම | 287,571,286 | 247,033,670 |
| විකුණුම් පිරිවැය | (143,328,431) | (109,631,277) |
| දළ ලාභය | 144,242,855 | 137,402,393 |
| පරිපාලන වියදම් | (80,938,692) | (61,508,414) |
| මෙහෙයුම් ලාභය | 63,304,163 | 75,893,979 |

| | | |
|---|---|---|
| මූල්‍ය ආදායම | 49,651,749 | 41,601,847 |
| මූල්‍ය වියදම | (551,000) | (651,369) |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 211,748 | 220,351 |
| | --------------- | --------------- |
| බදු පෙර ශුද්ධ ලාභය | 112,616,660 | 117,064,808 |
| ආදායම් බදු | (21,322,032) | (12,328,717) |
| | -------------- | --------------- |
| බදු පසු ශුද්ධ ලාභය | 91,294,628 | 104,736,091 |
| | ========= | ========= |

පහත සඳහන් නිරීක්‍ෂන කරනු ලැබේ.

(i) පසු ගිය වර්ෂයට සාපේක්‍ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 40,537,616 කින් හෙවත් සියයට 16 කින් වර්ධනය වී තිබුණි.

(ii) 2017 වර්ෂයට සාපේක්‍ෂව සමාලෝචිත වර්ෂයේ විකුණුම් පිරිවැය සහ පරිපාලන වියදම් සියයට 31 කින් වර්ධනය වී ඇති අතර මූල්‍ය වියදම් සියයට 15 කින් අඩු වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

| | | 2018 | 2017 |
|---|---|---|---|
| (i) | ජංගම වත්කම් අනුපාතය | 19 : 1 | 23:1 |
| (ii) | ක්‍ෂණික වත්කම් අනුපාතය | 18.9:1 | 23:1 |
| (iii) | දළ ලාභ අනුපාතය | 50% | 56% |

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

- 2017 වර්ෂයේ ජංගම අනුපාතය හා ක්‍ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 23:1 ක් හා 23:1 වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඒ පිළිවෙලින් 19:1 ක් හා 18.9:1 ක් ලෙස අඩු වී තිබුණි.

- 2017 වර්ෂයේ සියයට 56 ක් ව පැවති දළ ලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේ සියයට 50 දක්වා අඩු වී තිබුණි. මේ සඳහා විකුණුම් පිරිවැයේ ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොඩනැගිලි සැලැස්මක් සකස් කිරීම වෙනුවෙන් වර්ෂ 4 කට වැඩි කාලයක සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් සමාගමට ලැබිය යුතු වූ රු. 5,779,760 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර ගෙන නොතිබුණි. තවද එම මුදල ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ගෙවිය යුතු ශේෂයක් ලෙස ඇතුලත් කර නොතිබූ අතර එම මුදල අය කර ගැනීම අවිනිශ්චිත බව විගණනයේදී නිරීක්‍ෂණය විය. කෙසේ වුවද සමාගම විසින් මේ සඳහා හානිකරණය සඳහා ප්‍රතිපාදනය කර නොතිබුණි. | 2018.11.19 වන දින කළමනාකාර අධ්‍යක්‍ෂ , ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දන්වා සිටින ලද්දේ මෙම මුදල නොගෙවන බවයි. මේ අනුව මෙම වියදම ඉදිරියේදී අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන මුදල් අමාත්‍යාංශයෙහි අනුමැතිය ද සහිතව බොල් ණය ලෙස කපා දැමීමට කටයුතු කරනු ඇත. | වරාය අධිකාරිය සමඟ සාකච්ඡා කර අවසන් නිගමනයකට එළඹීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තෙල් ටැංකි 13 හි තෙල් නිමානය කිරීම සඳහා නවීන තාක්ෂණික උපකරණ භාවිතා නොකිරීම හේතුවෙන් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ශ්‍රී ලංකා රේගුව විසින් තෙල් මෙට්‍රික් ටොන් 3323 ක් අවස්ථා 5 කදී රාජසන්තක කර තිබුණි. මෙම තෙල් තොග වර්ෂයකට වරක් බැගින් ශ්‍රී ලංකා රේගුව මගින් රාජසන්තක කර නැවත විකුණන තෙක් එම තෙල් තොග සඳහා ගබඩා ගාස්තු අය කිරීමක් සිදු නොවන බව නිරීක්‍ෂණය විය. | අප ආයතනයේ තෙල් බෙදා හැරීමේ කටයුතු දැනට සිදු කරනුයේ Dip Measurement (Manual) ක්‍රම වේදය අනුවය. මෙමගින් ඉතා නිවැරදිව තොග ගණනයක් සිදු නොවේ. නිවැරදි මිණුම් කටයුතු සිදු කිරීම සඳහා Mass Flow Meters සවි කිරීමට පියවර ගනිමින් පවතී.<br><br>එකතු වන තෙල් තොග රාජ සන්තක කරන කාලය සහ ඒවා ගණනය කිරීම ශ්‍රී ලංකා රේගුව මගින් සිදු කරන බැවින් ඒ සඳහා අප ආයතනයට සෘජුව මැදිහත් වීමක් නොමැත. | තෙල් ප්‍රමාණනය සඳහා දියුණු තාක්‍ෂණික ක්‍රම භාවිතා කිරීම කළමනාකරණයේ වගකීම වේ. |